**මාන්තෙයි - බටහිර ප්‍රාදේශීය සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වූවද, ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2011 අප්‍රේල් 21 දිනදීය. තවද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2010 අප්‍රේල් 03 දිනදීය.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාන්තෙයි-බටහිර ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි-බටහිර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම්වල දැක්වෙන අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| | වියදම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | - | - | 02 | 2,895,328 | 01 | 15,184 |
| වර්ගීකරණ දෝෂ | 01 | 17,430 | - | - | - | - |

### 1.3.3 බැංකු සැසඳුම්

(අ) මාස 06කට අධික කාලයක් උපලබ්ධි වී නොතිබූ රු.1,205 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) නිකුත් කළ දින සිට මාස 06 ක් ගතවී තිබුණු වටිනාකම රු.57,520 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව නිසි කටයුතු සිදුකර නොතිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අධික කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.54,490 ක් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

විගණනයට අවශ්‍ය තෙරෙතුරු නොමැතිවීම නිසා වටිනාකම රු.6,089,709 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි සහ කළමණාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988** | | |
| (ඌ) IV වැනි පරිච්ඡේදයේ 96 වගන්තිය | - | පීඑස් 35 ආකෘතිය වෙනුවට පොදු 35 ආකෘතියෙහි වවුචර පිළියෙල කර තිබුණි. |
| (එ) IV වැනි පරිච්ඡේදයේ 166 වගන්තිය | - | ප්‍රධාන ලෙජරයෙහි සටහන් තැබීම සඳහා ජර්නලයක් පවත්වා නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 437** | - | රජයේ වාහන ශ්‍රී ලංකා රක්ෂන ආයතනයේ රක්ෂණ කළ යුතු නමුත් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ප්‍රාදේශීය සභාවේ වාහන පෞද්ගලික රක්ෂණ සමාගමක රක්ෂණය කර තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.581,140 ක්ව තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉකමවූ ආදායම රු.60,521 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් සහ බදු | - | - | - | - | - | - |
| (ii) | කල්බදු කුලී | 728 | 1,546 | 199 | 445 | 182 | 199 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 134 | 87 | - | 777 | 07 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,892 | 1,795 | - | 989 | 42 | - |

### 2.2.2 උසාවි දඩ මුදල්

2010 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් ලෙස ලැබිය යුතු මුදල ගණනය කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 6,805 | 6,597 | 208 | 5,299 | 6,328 | (1,029) |
| වෙනත් වියදම් | 1,738 | 2,128 | (390) | 2,050 | 484 | 1,566 |
| උප එකතුව | 8,543 | 8,725 | (182) | 7,349 | 6,812 | 537 |
| ප්‍රාග්ධන වියදම් | 1,106 | 2,467 | (1,361) | 925 | 8,658 | (7,733) |
| මුළු එකතුව | 9,649 | 11,192 | (1,543) | 8,274 | 15,470 | (7,196) |

======= ====== ====== ===== ====== ======

## 2.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | 03 | 01 |
| සහායක ශ්‍රේණි | 13 | 07 |
| සුළු සේවක | 14 | 14 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 6 |
| එකතුව | 30 | 28 |

## 2.5 වත්කම් කළමනාකරණය

----------------------------

### 2.5.1 අයවිය යුතු කාර්ය මණ්ඩල ණය

-------------------------------------

මියගිය ස්ථාන මාරු ලැබූ හෝ සේවය අතහැර ගියාසේ සලකන ලද නිලධාරීන්ට අදාළ වර්ෂ 05 කට අධික කාලයක් ගතවූ වටිනාකම රු.237,085 ක්වූ හිඟ සේවක ණය අයකරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(අ) වගන්තිය අනුව එක් අවස්ථාවක් සඳහාවූ සංග්‍රහ වියදම රු.1000කට සීමාවිය යුතුය. නමුත් සංග්‍රහ වියදම් වශයෙන් රු.58,864 ක් වැයකර තිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය